# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 පෙබරවාරි මස 11 වන දින

## II වන කොටස

## අතිරේකය

(2022.02.11 දින නිකුත් කරන ලදී)

# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 442 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ නඩුවක එක් එක් පාර්ශ්වයට නඩු තීන්දුවේ හෝ නඩු වාර්තාවේ අවසාන ආඥාවේ එක් සහතික පිටපතක් ගාස්තු අයකිරීමෙන් තොරව ලබා දීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 443 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 2 වන වගන්තිය මගින් කරනු ලැබූ සංශෝධනයට ආනුෂංගික වේ.

එල්.ඩී.-ඕ. 45/2017

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

> ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක  දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

> 1979 අංක 15 දරන පනතේ 442 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 442 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

> "නඩු තීන්දුවක හෝ අවසාන ආඥාවක හෝ යම් දිවුරුම් සාක්ෂියක හෝ නඩු වාර්තාවේ වෙනත් කොටසක පිටපත්

442. අපරාධ අධිකරණයක නඩු තීන්දුවකින් හෝ අවසාන ආඥාවකින් බලපෑමට ලක්ව ඇති යම් තැනැත්තකු විසින් එම නඩු තීන්දුවේ හෝ අවසාන ආඥාවේ හෝ යම් දිවුරුම් සාක්ෂියක හෝ එම නඩු වාර්තාවේ වෙනත් කොටසක පිටපතක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, ඒ තැනැත්තා විසින් එම පිටපත සඳහා ඉල්ලුම් කළ විට, යම් විශේෂ හේතුවක් නිසා එය ගාස්තු අයකිරීමෙන් තොරව ලබා දීම සුදුසු යයි අධිකරණය විසින් සලකනු ලබන්නේ නම් මිස, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අධිකරණ විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කලින් කල නිශ්චය කරනු ලබන ගාස්තුවක් ඒ සඳහා ගෙවීමෙන් පසුව අධිකරණය විසින් එම තැනැත්තා වෙත එම පිටපත ලබා දෙනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, අදාළ නඩුවේ චෝදනාකරු සහ සෑම චූදිත තැනැත්තකු ම වෙත එම නඩු තීන්දුවේ හෝ නඩු වාර්තාවේ අවසාන ආඥාවේ එක් සහතික කළ පිටපතක් බැගින් ගාස්තු අයකිරීමෙන් තොරව ලබා දෙනු ලැබිය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 443 වන වගන්තියේ (ආ) ඡේදයේ "442 වන වගන්තියේ සඳහන් ප්‍රමාණය අනුව ඒ සඳහා ගාස්තු ගෙවනු ලැබූ විට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "442 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 443 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව